# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2323/23 – 2023 මාර්තු මස 16 වැනි බ්‍රහස්පතින්දා – 2023.03.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2023 අංක 26 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/19/2021/E/362.
ප්‍රා.ලේ.ගේ යොමු අංකය: DS/GFG/L&L/05/141.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට *නැතහොත්*, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2023 මාර්තු මස 15 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

*උපලේඛනය*

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී –** ප්‍රාදේශීය ලේකම්, ගාල්ල කඩවත් සතර.

2. **ඉඩමේ විස්තරය.–** දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 100, කටුගොඩ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කටුගොඩ (ගාල්ල මහ නගර සභා සීමාව තුල) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද අංක GA/GFG/2022/197 හා 2022.08.26 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – මීගොඩ බඩල් ඇළ කොරටුවේ වත්ත – ප්‍රමාණය: හෙක්. 0.2213**

උතුරට: කසි 810012 (බඩල් ඇළ), කසි 810015 හි කලාප 5 පත්‍ර 1හි කැබලි අංක 1 (මාතර පාර), 3,4,5,6,7 සහ 11; නැගෙනහිරට: කසි 810015 හි කලාප 5 පත්‍ර 1හි කැබලි අංක 1 (මාතර පාර), 3,4,5,6,7 සහ 11; දකුණට: කසි 810015 හි කලාප 5 පත්‍ර 1හි කැබලි අංක 11 සහ කසි 810012 (බඩල් ඇළ); බටහිරට: කසි 810012 (බඩල් ඇළ).

EOG03 - 0177


1A – G 039109 – 19 (2023/03)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*